රුහුණු විශ්වවිද්‍යාලය

2016/2017 ශාස්ත්‍රවේදී (සාමාන්‍ය/විශේෂ) උපාධි - 3000 ස්ථලය
පළමු සමාසික පරීක්ෂණය - 2017 ඔක්තෝබර්/නොවැම්බර්

# GEO 31513 / 31613 – භූමි පරිභෝග සැලසුම්කරණය

ප්‍රශ්න හතරකට (04) පමණක් පිළිතුරු සපයන්න

කාලය : පැය 03

---

01. භූමි පරිභෝග සැලසුම්කරණයේදී වැදගත්වන භූමිය පිළිබඳ සංකල්ප මොනවා දැයි සාකච්ඡා කරන්න.

(ලකුණු 15)

02. පරිවහන භූමි පරිභෝග සැලසුම්කරනයෙන් ලබාගත හැකි වාසි ශ්‍රී ලංකාව ඇසුරින් නිදසුන් සහිතව පැහැදිලි කරන්න.

(ලකුණු 15)

03. (i) භූමි තක්සේරුකරණය යනු කුමක් දැයි නිර්වචනය කර එහි මූලධර්ම 03 ක් කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 06)

(ii) භූමි යෝග්‍යතාවට අදාළව ලෝක ආහාර හා කෘෂිකර්ම සංවිධානය (FAO) ඉදිරිපත් කළ වර්ගීකරණ ව්‍යුහය කෙටියෙන් පැහැදිලි කර ඉඩම් යෝග්‍යතාව ඇගයීමේ ක්‍රියාවලිය දළ සටහනක් ආශ්‍රයෙන් සාකච්ඡා කරන්න.

(ලකුණු 09)

04. නාගරික භූමි පරිභෝග ආකෘති සහ න්‍යායන් ඇසුරෙන් මාතර නගරයේ නාගරික කළාප වල අවකාශීය ව්‍යාප්තිය සිදුවී ඇති ආකාරය විමර්ශනය කරන්න.

(ලකුණු 15)

05. “ශ්‍රී ලංකාවේ භූමි පරිභෝගයේ අවකාශීය විවිධත්වය සඳහා දේශපාලන තීරණ හා සංසිද්ධි සුලබවම බලපා ඇත.” මෙම ප්‍රකාශය සුදුසු නිදර්ශන ඇසුරෙන් විමර්ශනය කරන්න.

(ලකුණු 15)

35

06. “වනහරනය සහ හායනය ශ්‍රී ලංකාවේ භූමි පරිහරණ රටාවේ දක්නට ඇති ප්‍රධානතම ගැටලුවකි.” ඉහත ප්‍රකාශය නිශ්චිත නිදසුන් සහිතව විවේචනාත්මකව විග්‍රහ කරන්න.

(ලකුණු 15)

07. “ශ්‍රී ලංකාවේ භූමි පරිහරණය සම්බන්ධයෙන් ඇති වී තිබෙන ගැටලු භූමි සම්පත් හායනය කෙරෙහි බලපා තිබේ.” ඉහත ප්‍රකාශය විවේචනාත්මක විග්‍රහ කරන්න.

(ලකුණු 15)

@@@@@@@